৩ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1970/13- 2016 ජුනි මස 08 වැනි බදාදා - 2016.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DSWA/LND/4/ACQUI/FI/24.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2005/E/151.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන අත්කර ගැනීමේ(සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම / පරවශතාවේ විස්තර :-*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සපුතන්ත්‍රිකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අ.ග.පි. 51 හි පිහිටි පහත සඳහන් කර ඇති ඉඩම.

01. කැබලි **අංක 266**

ඉඩමේ නම: පුරණ කුඹුර; ඉඩම් පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිලි දෙකක් ද, ස්ථිර බුදු මැදුරක් ද, ස්ථිර වැසිකිලි තුනක් ද ඇත; හිමිකම් කියන්නා: වරාපිටිය රම්මල පදිංචි කේ. එස්. ඇඩ්වින්, එච්. ඒ. නිකුලස්, ඩබ්ලිව්. ඒ. කරුණාසේන, කේ. චාර්ලිස්, එච්. පියසේන, එච්. ඒ. ගුණපාල, පී. පී. ගුණපාල; ප්‍රමාණය: හෙක්ටයාර්. 0.1267.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජුලි මස 21 වැනි දින පෙ.ව. 10.30ට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජුනි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ පරවශතාවය ලබා ගැනීම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්.කේ.ආර්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2016 අප්‍රේල් මස 22 වැනි දින.
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

06 - 751

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23604 - 24 - (2016/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.